## ශාන්තියේ බලයේ වැදගත්කම.

ශාන්ති සාගරය වන පියා, ශාන්ති අවතරණ වන ඔහුගේ දරුවන්ව මුණගැසීමට පැමිණ ඇත. අද ලෝකයේ අත්‍යාවශ්‍යම දේ සාමය වන අතර, ඔය දරුවන් එම ශාන්තිය පිරිනමන්නන්ය. විනාශ වන ධනය හෝ විනාශ වන ක්‍රම උපයෝගී කරගනිමින් මිනිසුන් කෙතරම් සාමය ලබාගැනීමට තැත් කළත්, ඔවුන්ට එයින් සැබෑ අවිනාශී සාමය ලබාගත නොහැක. වර්තමාන ලෝකය, ධනවත් මෙන්ම සතුට වෙනුවෙන් සියලුම පහසුකම් එහි තිබුණත්, එය තවමත් අවිනාශී සහ සදාකල් සාමයේ සිඟන්නෙකි. අධිපති ශාන්තිය පිරිනමන්නන්, ශාන්තියේ නිධන් ගබඩා සහ ශාන්තියේ ප්‍රතිමූර්ති වන ඔය ජීවාත්ම, එවන් ශාන්තිය සිඟන ජීවාත්මයන්ට ශාන්තියේ බිඳක් දී, ඔවුන්ගේ පිපාසාව සංසිඳ, ශාන්තිය වෙනුවෙන් ඔවුන්ගේ ආශාව ඉටු කල යුතුයි. අසාමයෙන් සිටින දරුවන් දැක, බාප්දාදාට ඔවුන් කෙරෙහි අනුකම්පාවක් ඇතිවෙයි. ඔවුන් බොහෝ උත්සාහ දරයි විද්‍යාවේ බලයෙන් ඔවුන් බොහෝ ස්ථාන වලට ළඟා වන අතර බොහෝ දේ සාදයි. ඔවුන්ට දහවල, රාත්‍රිය බවටත්, රාත්‍රිය දහවල බවටත් පරිවර්ථනය කළ හැකි නමුත් ඔවුන්ගේ ආදිතම ධර්මය වන ශාන්තිය ලබා ගැනීමට ඔවුන්ට නොහැක. ඔවුන් කෙතරම් සාමය පසුපස හඹා ගියත්, සාමයේ යම් තාවකාලික ලැබීමක් පසුපස ගියත්, ප්‍රතිඵලය අශාන්තියම පමණයි. අවිනාශී ශාන්තිය, සියලුම ජීවාත්මයන්ට දෙවියන්ගෙන් ලැබෙන උපත් අයිතියයි, නමුත් ඔවුන්ගේ උපත් අයිතිය වෙනුවෙන් ඔවුන් බොහෝ උත්සාහ දරයි. එය තත්පරයක ලැබීමකි. කෙසේවෙතත්, සම්පූර්ණ හැඳින්වීම නොමැති නිසා, තත්පරයක ලැබීම වෙනුවෙන් පවා ඔවුන් බොහෝ වැටි වැටී ගමන් කරයි ඔවුන් හඬමින්, කෑගසමින් අසහනයෙන් සිටියි. ශාන්තිය වෙනුවෙන් වටේ සැරිසරන ඔබගේ සහෝදර ජීවාත්මයන්ට, සහෝදරත්වයේ දෘෂ්ඨිය ලබාදෙන්න. මෙම දෘෂ්ඨියෙන් ඔවුන්ගේ ලෝකය පරිවර්ථනය වෙයි.

ශාන්තියේ අවතරණ වන ඔය සියලුම ජීවාත්ම, ශාන්තියේ ප්‍රතිමූර්ති ලෙසින් නිරන්තරයෙන් ස්ථාවරව රැඳී සිටිනවාද? ඔබ අශාන්තියට, සදාකාලයටම ආයුබෝවන් කියා තිබෙනවා නේද? ඔබ අසාමයට, ආයුබෝවන් කීමේ උත්සවය සැමරුවාද? නොඑසේ නම්, ඔබ දැන් එය කිරීමට යනවාද? තවමත් අසාමයට ආයුබෝවන් කීමේ උත්සවය සමරා නොමැති අය, දැන් මෙහිදී එය කිරීමට යනවාද? මේ සඳහා අපි දිනයක් වෙන් කළ යුතුද? මෙම උත්සවය දැන් පැවැත්වීමට අවශ්‍ය අය අත් ඔසවන්න! ඔබගේ සිහින වලින් පවා අශාන්තිය ඇති නොවේවා. ඔබගේ සිහින පවා සාමකාමී වී තිබෙනවා නේද? පියා, ශාන්තිය පිරිනමන්නා වන අතර ඔබලා ශාන්තියේ ප්‍රතිමූර්තීන්ය. ඔබගේ ධර්මය (ආගම) සාමය වන අතර ඔබගේ කර්මය (ක්‍රියා), ශාන්තියයි. එබැවින් අසාමය තිබෙන්නේ කෙසේද? ඔබ සියලු දෙනාගේම කර්මය කුමක්ද? ශාන්තිය ලබාදීම. දැන් පවා ඔබගේ බැතිමතුන් ආරති (වන්දනා ක්‍රමයක්) සිදුකරන විට, ඔවුන් පවසන්නේ කුමක්ද? 'ශාන්තිය පිරිනමන්නන්.' එබැවින් ඔවුන් ගායනා කරන්නේ කාගේ ප්‍රශංසාවද? ඔබගේද, පියාගේ පමණක්ද? ශාන්තිය පිරිනමන දරුවන්, නිරන්තරයෙන් ශාන්තියේ මහා දානපතියන්ය, එමෙන්ම මෙම වරදානයද ලබා දෙන අයයි. ඔබ අධිපති දැනුමේ සූර්යයන් වී, ලොව පුරා ශාන්තියේ කිරණ පතුරුවා හරින අයයි. පියා සමඟ, ඔබත් අධිපති දැනුමේ සූර්යයන් සහ ශාන්තියේ කිරණ පතුරන, අධිපති සූර්යයන් වීමේ කුල්මත් බව ඔබට තිබෙනවා නේද?

ඔබට තත්පරයකදී, ඔබගේ ආකල්පය තුළින්, ස්ව ධර්මයේ හැඳින්වීම ලබා දී, ඔවුන්ව ඔවුන්ගේ මුල් ස්වරූපයේ ස්ථාවර කිරීමට හැකිද? කුමන ආකල්පයද? ඔබගේ සහෝදරයන් වන මෙම ජීවාත්මයන්ද, පියාගෙන් ඔවුන්ගේ උරුමය හිමි කරගත යුතු බවට. මෙම පිවිතුරු ආකල්පයෙන්, එනම්, මෙම පිවිතුරු හැඟීමෙන්, ඔබට ජීවාත්මයන්ට අත්දැකීමක් ලබා දිය හැකිද? ඇයි? පිවිතුරු හැඟීම්වල ප්‍රතිලාභය අනිවාර්යෙන් ලැබෙයි. ඔබ තුළ සියලු දෙනාටම ශ්‍රේෂ්ඨ පැතුම්, කිසිදු ආත්මාර්ථකාමි චේතනාවකින් තොර, යහපත් පැතුම් තිබේ. ඔබට අනුකම්පාවේ සහ යහපත ගෙන ඒමේ හැඟීම් තිබේ. ඔබට මෙම හැඟීම් වල ප්‍රතිඵල නොලැබීම, කිසිසේත් සිදුවිය නොහැක්කක්. බීජයක් ශක්තිමත් වන විට, ඔබට අනිවාර්යෙන් ඵලය ලැබෙයි. නිරන්තරයෙන් සරලව මෙම ශ්‍රේෂ්ඨ හැඟීම්වල බීජය, අවධානය නමැති ජලයෙන් තෙමන්න, එවිට ඔබට ක්ෂණික දිස්වන ඵලයේ ස්වරූපයෙන්, අනිවාර්ය ශක්තිමත් ඵල ලැබෙයි. යමක් සිදුවෙයිද නැද්ද, ගැන ප්‍රශ්නයක් ඇති නොවෙයි. නිරන්තර අවධානය නමැති ජලය තිබීම යනු, සියලුම ජීවාත්ම වෙනුවෙන් යහපත්

පැතුම් තිබීමයි. ඔබට නියත වශයෙන්ම ලෝක සාමයේ දිස්වන ඵලය ලැබෙයි. පියා සමඟින්ම, ඔය සියලු දරුවන්ද, සියලු දෙනාගේ ආශාවන් ඉටු වන පරිදි, සියලු ජීවාත්මයන්ගේ බොහෝ උපත් වල ආශාවන් ඉටු කරයි.

අශාන්තියේ හඬ දැන් සෑම තැනකම රැව් පිළිරැව් දෙන අතර සියලුම දිශාවන්හි මිනිසුන් අශාන්තිය අත්විඳිනවා - ඔවුන්ගේ සිරුරුවල, මනසේ, ධනයේ සහ සම්බන්ධතාවල. බිය හේතුවෙන්, ශාන්තිය අත්විඳිනවා වෙනුවට, ඔවුන්ට ලැබීම් අත්වන සියලු ක්‍රම තුළින් ඔවුන් අශාන්තිය අත්විඳිනවා. අද ජීවාත්ම, එක හෝ තව ආකාරයක භීතියේ බලපෑමට හසු වී සිටියි. ඔවුන් ආහාර ගනී, ගමන් යයි, ආදායමක් උපයා තාවකාලික සතුටක් අත්විඳින නමුත්, ඒ සියල්ල වන්නේ බියෙන්ය. හෙට දින සිදුවන්නේ කුමක්ද කියා ඔවුන් නොදනී. එබැවින් භීතියේ සිහසුන ඇති විට, නායකයා, භීතියේ පුටුවක් (තත්ත්වයක්) මත අසුන්ගෙන සිටින විට, ජනතාවගේ තත්ත්වය කුමක් වෙයිද? නායකයා ශ්‍රේෂ්ඨ වන තරමට ඔහුට වැඩි ආරක්ෂක සේනාවක් සිටියි. ඇයි? බිය ඇති නිසා. එබැවින් භීතියේ සිහසුනක් මත අසුන්ගෙන සිටින විට, ලැබෙන තාවකාලික සතුට කුමක්ද? එය ශාන්තිය වෙයිද, අශාන්තිය වෙයිද? බියෙන් පිරී සිටින එවන් දරුවන්ට නිරන්තර සතුටේ සහ ශාන්තියේ දිවියක් ලබා දීම සඳහා, බාප්දාදා ඔය සියලුම දරුවන්ව, ශාන්තියේ අවතරණ ලෙසින් උපකරණ බවට පත් කර ඇත. ශාන්තියේ බලයෙන් ඔබට කිසිවක් වියදම් නොකර, එක් තැනක සිට තවත් තැනකට කෙතරම් දුර යා හැකිද? මේ ලෝකය පවා ඉක්මවා. ඔබට ඉතා පහසුවෙන් ඔබගේ මිහිරි නිවසට ළඟා විය හැක. එයට යම් උත්සාහයක් දැරීමට සිදුවනවාද? ශාන්තියේ (නිහැඬියාව) බලයෙන් ඔබ කෙතරම් පහසුවෙන් පදාර්ථ ජයගත්තෙක් සහ මායා ජයගත්තෙක් වනවාද? කුමක් තුළින්ද? ජීව අවධානයේ බලයෙන්. පරමාණුක (ඇටම්) බලය සහ ආත්මික බලය යන දෙකම එකමුතු වූ විට, ජීවාත්මයන්ගේ බලයෙන්, සතෝප්‍රධාන් බුද්ධි තුළින් පරමාණුක බලය ද සතුට වෙනුවෙන් කාර්යයන් සිදුකරන විට, එවිට, බල දෙකෙහිම එකමුතුකමින්, සාමයේ ලෝකය මෙම පෘථිවිය මත හෙළිදරව් වෙයි, මන්ද, සාමකාමී සහ ප්‍රීතිමත් දිව්‍යලෝක රාජධානිය තුළ, බලයන් දෙකම පවතී. එබැවින් සතෝප්‍රධාන් බුද්ධියක් යනු, සෑම විටම ශ්‍රේෂ්ඨ සහ සත්‍ය ක්‍රියා සිදුකරන බුද්ධියකි. සත්‍යය යනු අවිනාශී බවද වෙයි. අවිනාශී පියා සහ අවිනාශී ජීවාත්මයේ අවධානයෙන් සෑම ක්‍රියාවක්ම කිරීමෙන්, ලැබීම ද අවිනාශී වෙයි. ඔවුන් සත්‍ය ක්‍රියා ගැන කතා කරන්නේ මේ නිසාය. එබැවින් ඔබ නිරන්තරයෙන් ශාන්තිය ලබා දෙන ශාන්තියේ අවතරණයි. ඔබට වැටහෙනවාද? අච්චා.

ඔවුන්ගේ සතෝප්‍රධාන් ස්ථිතියෙන් සෑම විටම සත්‍ය ක්‍රියා සිදුකරන ජීවාත්මයන්ට, ඔවුන්ගේ බලවත් සුබ පැතුම් වලින් ජීවාත්මයන්ට ශාන්තියේ ඵලය ලබා දෙන ජීවාත්මයන්ට, අධිපති ශාන්තිය පිරිනමන්නන් ලෙසින් සහ ශාන්තියේ දේවතාවන් ලෙසින් ලෝකය පුරා ශාන්තියේ රැස් පතුරුවා හරින අයට, ඔහුගේ විශේෂ කාර්යයේදී පියා සමඟ සහයෝගී වන ජීවයන්ට, බාප්දාදාගේ සෙනෙහස, සිහි කිරීම සහ නමස්තේ.

**නොබෙල් ත්‍යාග ලාභී, මහාචාර්ය බ්‍රයන් ජෝසප්සන් (විද්‍යාඥ) බාප්දාදා මුණගැසෙමින්:**

ඔබ ශාන්තියේ බලයේ අත්දැකීම අත්විඳිනවාද? ශාන්තියේ බලය, මුළු ලොවම සාමකාමී කරවයි. ඔබත් සාමයට ප්‍රිය කරන ජීවාත්මයක් නේද? විද්‍යාවේ බලය, නිහැඬියාවේ බලයත් සමඟ නිවැරදිව භාවිත කිරීමෙන්, ඔබට ලොවට යහපත ගෙනෙන උපකරණයක් විය හැක. විද්‍යාවේ බලයත් අවශ්‍යයි, නමුත් ඔබට සතෝප්‍රධාන් බුද්ධියකින් එය නිවැරදිව භාවිත කළ හැක. අද, එය නිවැරදි ආකාරයකින් භාවිත කරන්නේ කෙසේද යන දැනුම නොමැත. මෙම දැනුමේ පදනමට අනුව එම විද්‍යාවම නව ලෝකය ස්ථාපිත කිරීමට උපකරණයක් වෙයි. කෙසේවෙතත් මෙම දැනුම නොමැති නිසා ඔබ විනාශය කරා ගමන් කරනවා. එබැවින් දැන් සාමයේ බලයේ පදනමට අනුව, විද්‍යාවේ දැනුම ඉතා හොඳ කාර්යයන් සඳහා භාවිත කරන උපකරණයක් වන්න. ඔබ මෙයින්ද නොබෙල් ත්‍යාගයක් හිමි කරගන්නවා නොවේද? මන්ද, මෙම කාර්යයට අවශ්‍යතාවයක් තිබේ. ඕනෑම විටෙක යම් විශේෂිත දෙයක අවශ්‍යතාවයක් තිබෙන විට සහ ඒ සඳහා කෙනෙක් උපකරණයක් වන විට, සෑම කෙනෙක්ම එම ජීවාත්මය දෙස ශ්‍රේෂ්ඨ බැල්මකින් බලයි. එබැවින් ඔබ කළ යුත්තේ කුමක්ද කියා ඔබට වැටහෙනවාද? එබැවින් වර්තමානයේ විද්‍යාව සහ නිහැඬියාව අතර ඇති සම්බන්ධය කුමක්ද සහ දෙකෙහි සම්බන්ධයෙන් කෙතරම් සාර්ථකත්වයක් තිබිය හැකිද කියා පර්යේෂණය කරන්න. ඔබ පර්යේෂණ කිරීමට කැමැත්තක් දක්වනවා නේද? දැන් මෙය කරන්න. ඔබට කිරීමට ඉතා විශාල කාර්යයක් තිබේ. ඔබ එවන් ලෝකයක් නිර්මාණය කරනවා නේද? අච්චා.

**බාප්දාදා බ්‍රිතාන්‍ය කණ්ඩායම මුණගැසෙමින්:**

බොහෝ කලක් නැතිව සිට දැන් හමුවූ දරුවන් සෑම විටම සිටින්නේ පියා සමඟයි. ඔබ සෑම විටම පියා ඔබ සමඟ සිටීම අත්විඳිනවා නේද? ඔබ සුළුවෙන් හෝ පියාගේ ආශ්‍රයෙන් ඉවත් වුවොත්, මායාගේ දෘෂ්ඨිය ඉතා තියුණුයි. ඔබ ඉවතට ගොස් ඇති බව දැක, එබැවින් ඇය ඔබව ඇය සතු කරගනී. ඔබ සුළුවෙන් හෝ ඉවතට නොයා යුත්තේ මේ නිසයි. නිරන්තරයෙන් පියාගේ ඇසුරේ ඉන්න. සෑම විටම ඔබ සමඟ සිටීමට බාප්දාදාම ඉදිරිපත් වන බැවින්, මෙම ආශ්‍රය ලබාගන්න. මෙසේ පවසන, පියාගේ වැනි ආශ්‍රයක්, ඔබට මුළු කල්පය පුරාවටම නොලැබෙයි එන්න, ඇවිත් මගේ ආශ්‍රයේ ඉන්න. ඔබට ස්වර්ණමය යුගයෙදිවත් එවන් භාග්‍යයක් නොලැබෙයි. ස්වර්ණමය යුගයෙදීත් ඔබ සිටින්නේ, ජීවාත්මයන්ගේ ආශ්‍රයේය. මුළු කල්පය පුරාවටම ඔබට පියාගේ ආශ්‍රය ලැබෙන්නේ කෙතරම් කාලයකටද? එය ඉතා කෙටි කාලයකට නොවේද? ඉතා කෙටි කලකදී ඔබට මෙතරම් විශාල භාග්‍යයක් ලැබෙයි. එබැවින් ඔබ සෑම විටම ඔහු සමඟ සිටිය යුතුයි, නේද? නිරන්තරයෙන් ශක්තිමත් ස්ථිතියක ස්ථාවරව සිටින දරුවන් දෙස, බාප්දාදා බලයි. එවන් ආදරණීය දරුවන් සිටින්නේ බාප්දාදා ඉදිරියේයි. සෑම සියලු දරුවෙක්ම ඉතාමත්ම ආරණීයයි. බොහෝ සෙනෙහසින් යුතුව, බොහෝ විවිධ දුර ඈත ස්ථාන වලින් තෝරාගෙන, ඔබ සෑම කෙනෙක්ව, බාප්දාදා එකට එකතු කරගෙන තිබේ. මේ ආකාරයෙන් තෝරාගෙන ඇති දරුවන්, සෑම විටම ශක්තිමත්ය ඔවුන් දුර්වල විය නොහැක. අච්චා.

**පෞද්ගලික හමුවීම්:**

**විශේෂ නළුවෙක්, සෑම පියවරකදීම සහ සෑම තත්පරයකදීම, සෑම විටම අවධානයෙන් සිටින සහ නොසැලකිලිමත් නොවන කෙනෙකි.**

ඇවිදින විට සහ එහෙ මෙහෙ යන එන අතර සහ කමින් බොමින් සිටින අතර, මෙම අසීමිත ලෝක නාටක වේදිකාවේ, ඔබ විශේෂ නළුවෙක් බව, ඔබ නිරතුරුවම අත්විඳිනවාද? විශේෂ නළුවන් වන අය, සෑම විටම තම ක්‍රියාවන් කෙරෙහි අවධානයක් යොමු කරයි, එනම්, සෑම විටම ඔවුන්ගේ චරිත කොටසට අවධානය යොමු කරයි, මන්ද, මුළු නාටකයම රඳා පවතින්නේ ප්‍රධාන නළුවා මතයි. එබැවින් මුළු නාටකයේම පදනම ඔබයි, එහෙම නේද? එබැවින් ඔය විශේෂ ජීවාත්ම හෝ විශේෂ නළුවන්, මෙතරම් අවධානයක් යොමු කරනවාද? විශේෂ නළුවන් කිසිම විටෙක නොසැලකිලිමත් නැහැ, ඔවුන් සෑම විටම සිටින්නේ අවධානයෙන්. එබැවින් ඔබ කිසිම විටෙක නොසැලකිලිමත් වන්නේ නැහැ නේද? 'මට හැකි සෑම දෙයක්ම මා කරනවා, මා එහි ළඟා වෙයි.' ඔබ මේ ආකාරයෙන් සිතන්නේ නැහැ නේද? ඔබ සෑම දෙයක්ම කරනවා, නමුත් කුමන වේගයකින්ද? ඔබ ඉදිරියට ගමන් කරනවා, නමුත් ඔබ ගමන් කරන්නේ කුමන වේගයකින්ද? වේගයෙහි වෙනසක් තිබෙනවා නේද? ඇවිදින කෙනෙක් සහ අහස් යානයක පියාසර කරන කෙනෙක් අතර විශාල වෙනසක් තිබේ. ඇවිදින කෙනා ගමන් කරන අතර, පියාසර කරන කෙනා ද ගමන් කරන බව කියයි, නමුත් විශාල වෙනසක් තිබේ. එබැවින් ඔබ බ්‍රහ්මකුමරෙක් වීමෙන් පසුව නිකම්ම ගමන් කරන්නේ නම්, ඉන් අදහස් වන්නේ ඔබ ගමන් කරන බවයි, නමුත් කුමන වේගයෙන්ද? තම ගමනාන්තයට නිසි වෙලාවට ළඟා වෙන්නේ, සීඝ්‍ර වේගයක් ඇති අය පමණයි. එසේ නැතිනම් ඔවුන්ව හැරදමා යනු ඇත. මෙහිද ඔබට ලැබීමක් තිබේ, නමුත් එය සූර්ය වංශයේද, චන්ද්‍ර වංශයේද? එහි වෙනසක් තිබෙනවා නේද? එබැවින් සූර්ය වංශයේ කොටසක් වීම සඳහා, ඔබගේ සෑම සිතිවිල්ලක් සහ වචනයකින්ම සාමාන්‍ය බව ඉවත් කරන්න. ප්‍රධාන නළුවෙක් සාමාන්‍ය රංගනයක් ඉදිරිපත් කරන විට, සියලු දෙනාම ඔහුව හාස්‍යයට ලක් කරනවා නේද? එබැවින් මෙහිද, ඔබ විශේෂ නළුවෙක් යන අවධානය සෑම විටම තබාගන්න, එබැවින් ඔබගේ සෑම ක්‍රියාවක්ම විශේෂ විය යුතුයි, ඔබගේ සෑම පියවරක්ම විශේෂ විය යුතුයි, ඔබගේ සෑම තත්පරයක්ම, සෑම මොහොතක් සහ සෑම සිතිවිල්ලක්ම ශ්‍රේෂ්ඨ විය යුතුයි. සාමාන්‍ය වූයේ විනාඩි පහක් පමණක් බව නොසිතන්න. විනාඩි පහ, නිකම්ම විනාඩි පහක් නොවෙයි, නමුත් සංගම යුගයේ විනාඩි පහක් ඉතාමත්ම වැදගත් මෙන්ම අර්ථාන්විතයි. විනාඩි පහක්, වසර පහකට වඩා ශ්‍රේෂ්ඨයි, එබැවින් එතරම්ම අවධානයක් යොමු කරන්න. මෙය, තීව්‍ර උත්සාහ දරන්නෙක් වීම ලෙස හැඳින්වෙයි. තීව්‍ර උත්සාහ දරන්නන්ගේ පාඨය කුමක්ද? 'දැන් නොකරන්නේ නම්, කිසිදා නොවෙයි.' එබැවින් ඔබ සෑම විටම මෙය සිහියේ තබා ගන්නවාද? ඔබ රාජධානියේ භාග්‍යය සෑම කලටම හිමි කරගැනීමට පතන්නේ නම්, ඔබ සෑම විටකම අවධානය යොමු කළ යුතුයි. සෑම විටකම, ටික වෙලාවක් අවධානය යොමු කිරීමෙන්, ඔබට දීර්ඝ කාලයක් පුරාවට, නිරන්තර ලැබීම් හිමි කරගැනීමට මඟ පෑදෙයි. එබැවින් සෑම විටෙකම මෙම අවධානය තබාගන්න, එමෙන්ම ඔබ ඇවිදින විට සහ ගමන් කරන අතර

සාමාන්‍ය නොවීමට තමන්ව පරීක්ෂා කර බලන්න. පියාණන්, උත්තරීතර ජීවය ලෙස හැඳින්වෙයි, එබැවින් ඔහු උත්තරීතරයි. එසේ නම් පියා කෙබඳුද, දරුවන්ද උත්තරීතරයි, එනම්, ඔවුන් සෑම අන්දමකින්ම ශ්‍රේෂ්ඨයි.

එබැවින් දැන් ඔබගේ උත්සාහයන් තීව්‍ර කරගන්න, එමෙන්ම ඔබගේ සේවය වෙනුවෙන් අඩු කාලයක් සහ අඩු උත්සාහයක් යොදන අතරම වැඩි සාර්ථකත්වයක් අත්දකින්න. බොහෝ දෙනෙකුගේ කාර්යයන් එක් පුද්ගලයෙක් කළ යුතුයි. එබැවින් එවන් සැලසුමක් සාදන්න. පන්ජාබය බොහෝ පැරණි. එය ආරම්භයේ සිටම සේවය වෙනුවෙන් මැදිහත් වී ඇත, එබැවින් ආරම්භක ස්ථානයේ අය, දැන් ආදි මැණික් ටිකක් සොයා ගත යුතුයි. කෙසේවෙතත් පන්ජාබය, සිංහයා ලෙස හැඳින්වෙන අතර සිංහයෙක් නාද කරයි. නාද කරනවා යනු විශාල හඬකි. ඔබ කරන්නේ කුමක්ද, එමෙන්ම කරන්නේ කවුද, කියා අප දැන් බලමු?

**වරදානය:** ඔබ අම්රිත් වේලාවේ සිට රාත්‍රි කාලය දක්වා, සෑම දෙයක්ම නිවැරදිව සහ සිහිපත් කිරීමේ විනය ඇතිව කරන, සාර්ථකත්වයේ ප්‍රතිමූර්තියක් වේවා.

ඔබ අම්රිත් වේලාවේ සිට රාත්‍රිය දක්වා කුමක් කළත්, එය සිහිපත් කිරීමේ විනයට අනුකූලව කරන්න, එවිට ඔබට සෑම ක්‍රියාවකින්ම සාර්ථකත්වය ලැබෙයි. සියල්ලට වඩා ශ්‍රේෂ්ඨතම සාර්ථකත්වය වන්නේ, ප්‍රායෝගික ඵලය ලෙස, අතීන්ද්‍රීය සුඛය අත්විඳීමයි. නිරන්තරයෙන් ප්‍රීතිය සහ සතුටේ රැළිවල නොකඩවා ගමන් කරන්න. එබැවින් ඔබට මෙම ක්ෂණික ඵලය ලැබෙන අතරම ඔබට අනාගතයේද ඵලය හිමි වෙයි. මෙකල්හි ප්‍රායෝගික ක්ෂණික ඵලය, ඔබගේ බොහෝ අනාගත උපත්වල ඵලයට වඩා ශ්‍රේෂ්ඨයි. ඔබ දැන් යමක් කර, සැනෙකින් එහි ප්‍රතිලාභය ලබාගනී. මෙය ප්‍රායෝගික, ක්ෂණික ඵලය ලෙස හැඳින්වෙයි.

**පාඨය:** තමන් උපකරණයක් බව සලකා සෑම ක්‍රියාවක්ම කරන්න, එවිට ඔබ සෙනෙහසින් යුතුව නොබැඳී සිටින අතර, 'මම' යන අවධානය නොතිබෙයි.

***** ඕම් ශාන්ති *****